**ඇඹිලිපිටිය නගර සභාව - 2022**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ඇඹිලිපිටිය නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------- | ------------ |
| (අ) | එකතුව රු.13,027,436ක් වූ ට්‍රැක්ටර් 04ක්, මෝටර් ග්‍රේඩරයක් හා පුස්තකාල පොත් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත නොකර සහ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම්වල මෙය නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කරත්ත 07ක් සහ පුස්තකාල පොත් වටිනාකම රු.372,725ක් වැඩියෙන් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම්වල මෙය නිවැරදි කරන බව. | - එම - |
| (ඇ) | දේශීය ණය සංවර්ධන අරමුදල් ණය ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.5,147,338ක් වැඩියෙන් දක්වා තිබුණි. | ණය වෙනුවෙන් ගෙවිය යුතු පොළිය ඇතුළත්ව ඇත. ඉදිරියේදී එම ණය පොළිය වෙන්කර පෙන්වන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------- | ------------------------ | ------------- |
| 2010-2020 වර්ෂ අතර කාලය තුළ අවස්ථා 08ක දී ලබා දී තිබුණු රු.681,567ක අත්තිකාරම්, මුදල් රෙගුලාසි 371(5) පරිදි පියවා නොතිබුණි. | නොපියවූ අත්තිකාරම් වලින් රු.25,357ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී ඇත. සෙසු අත්තිකාරම් පියවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.26,452,472ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,169,228ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,303,000 | 19,456,728 | 13,686,874 | 61,541,824 | 18,423,000 | 17,927,025 | 15,839,898 | 49,786,646 |
| කුලී | 25,334,200 | 11,746,140 | 13,042,383 | 6,131,941 | 25,194,400 | 12,877,972 | 9,775,534 | 8,459,378 |
| බලපත්‍ර ගාස්තු | 3,156,500 | 1,891,797 | 1,766,796 | 589,000 | 3,256,000 | 1,892,179 | 1,752,679 | 2,923,402 |
| වෙනත් ආදායම් | 10,089,700 | 7,390,232 | 6,924,468 | - | 9,479,700 | 6,068,539 | 6,065,539 | - |
| | 56,883,400 | 40,484,897 | 35,420,521 | 68,262,765 | 56,353,100 | 38,765,715 | 33,433,650 | 61,169,426 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වසර 05කට වඩා පැරණි රු.49,747,851ක වරිපනම් ශේෂයක් පැවතිණි. | හිඟ අයකර ගැනීමට අවසාන නිවේදන බෙදමින් පවතී. පසුව නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02ක රු.156,000ක හිඟහිටි ඉඩම් හා ගොඩනැගිලි බදු ශේෂයක් පැවතිණි. | හිඟ බදු අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ඇ) | වසර 03ත් වසර 15ත් අතර කාලයක් හිඟහිටි කඩ කාමර කුලී රු.3,843,893ක් හා පෙර ගෙවුම් මුදල් (key money) රු.1,281,200ක් අයකර නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් රැස් කළ යුතු වේ. |
| (ඈ) | සභා බල ප්‍රදේශයේ වූ 285ක මුළු ත්‍රීරෝද රථ සංඛ්‍යාවෙන් ත්‍රීරෝද රථ 283ක් ම 2022 වර්ෂය වෙනුවෙන් රු.141,500ක ගාස්තු ගෙවා නොතිබුණි. එමෙන්ම, 2022 වර්ෂය ද ඇතුළුව ඉකුත් වර්ෂ 04ක් වෙනුවෙන් රු.541,000ක ගාස්තු හිඟහිටිව පැවතිණි. ත්‍රීරෝද රථ සංගමය හා නගර සභාව අතර පැවති සියලු සාකච්ඡා නිශ්චිත එකඟතාවකින් තොරව අවසන් වී තිබීම මෙයට හේතුව වී තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීමේ දෝෂ නිසා හිඟ මුදල වැඩි වීමක් පෙන්නුම් කරයි. ත්‍රීරෝද රථ සංගමයෙන් ලබාගත් යාවත්කාලීන කරන ලද ලේඛන අනුව ගිණුම් නිවැරදි කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | LED දැන්වීම් පුවරුවක් 2019 වර්ෂයේ ස්ථාපනය කර රු.2,689,200ක් වූ එම වියදම මාස 20කින් පියවා ගැනීමට සැලසුම් කර තිබුණි. එහෙත්, දැන්වීම් පුවරුව ස්ථාපිත කර මාස 34ක දී ලද ආදායම රු.35,500ක් පමණක් විය. | මෙම දැන්වීම් පුවරුව බදු දීමට ටෙන්ඩර් කැඳවූවද, කිසිවෙකු ඉදිරිපත් නොවීය. 2023 වර්ෂය සඳහා විවෘත ටෙන්ඩර් කැඳවා බදු දීමට කටයුතු කරන බව. | දරන ලද වියදමට ප්‍රමාණවත් උපයෝජනයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද විනෝද ප්‍රසංග 04ක් වෙනුවෙන් එම අයිතිකරු විසින් ඉදිරිපත් කළ ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව පදනම් කර ගෙන විනෝද බදු ලෙස රු.246,000ක් පමණක් අයකර තිබුණි. එහෙත්, එම ප්‍රසංගවල දී අලෙවි වූ තථ්‍ය ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාවේ නිවැරදිතාව තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. | විනෝද බදු අයකිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා පවතී. අක්‍රමිකතා වාර්තා වූව හොත් තැන්පතුව සභාව සතු කර ගැනේ. ඉදිරියේදී උපරිම ලෙස බදු අයකිරීමට කටයුතු කරනු ලබන බව. | සභාව වෙත අයවියයුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණු අතර, මහජන පැමිණිලි මත පමණක් අනවසර ඉදිකිරීම් හඳුනා ගෙන තිබුණි. එමෙන්ම, අනවසර ඉදිකිරීම් ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි. | ඉදිකිරීම් ඉවත් කිරීමේදී විවිධ ගැටළු ඇති වේ. ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරියෙන් උපදෙස් ඉල්ලා සිටියද, මේ දක්වා ලැබී නොමැති බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඈ) | දිරාපත් නොවන කසළ විශාල ප්‍රමාණයක් පරිසරයට අහිතකර වන ලෙස දෛනිකව බැහැර කර තිබුණි. නොදිරන කසළ මධ්‍යස්ථානය සඳහා 2022 ජූලි මාසයේ ලබා දී තිබුණු රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රය 2022 දෙසැම්බර් මාසය වන විටත් අභාවිතව පැවතුණි. 2021 වර්ෂයේදී කිලෝග්‍රෑම් 164,280ක් වූ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය 2022 වර්ෂයේදී කිලෝග්‍රෑම් 6,240ක් දක්වා අඩු වී තිබුණු අතර, අලෙවි ආදායම පසුගිය වසරට සාපේක්ෂව රු.1,580,400කින් අඩු වී තිබුණි. | ආර්ථික හා සෞඛ්‍ය අර්බුදය නිසා අපේක්ෂිත ආදායම උපයාගත නොහැකි විය. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය වැඩි කිරීමට හා බෙලර් යන්ත්‍රය භාවිතයට ගැනීමට කටයුතු කරමින් සිටින බව. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැසුමක් සකස්කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.2 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඇඹිලිපිටිය උඩගම පිහිටි මල්වත්ත ඉඩමේ හෙක්ටයාර් 0.1285ක් වූ බිම් කොටසේ මායිම් නිරවුල් කර නොතිබීම හා සභාව සතු ඉඩමක් බවට ප්‍රදර්ශනය කර නොතිබීම නිසා අනවසර අත්පත් කර ගැනීමකට ලක්වීමේ අවදානමක් පැවැතිණි. | මායිම් නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සභාව සතු දේපළවල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කළ යුතු වේ. |